# සයිප්‍රස්හි සංඝනායක ලෙස පූජ්‍ය සෝරත හිමිපාණන් පත්වූ වගයි



**ස**යිප්‍රසයේ ශ්‍රීලංකාරාමාධිපති සහ කැලණිය වේවැල්දූව ශ්‍රී නාගරුක්ඛාරාම පුරාණ විහාරාධිපති වූත් පූජ්‍ය මොරවක සෝරත හිමිපාණන් වෙත ධර්මකීර්ති ශ්‍රී කාව්‍ය විභූෂණ ගෞරවනාමය සහිතව සයිප්‍රසයේ ප්‍රධාන සංඝනායක ධූරයට පත්වීම පිළිබඳව අක්තපත්‍ර පිළිගැන්වීමේ මහා පුණ්‍යෝත්සවය පසුගිය සැප්තැම්බර් මස 28 වෙනි ඉරුදින පෙරවරු 11.30 ට සයිප්‍රසයේ රුසියානු සංස්කෘතික මධ්‍යස්ථානයේ දී අති උත්කර්ෂවත් අයුරින් පැවැත්විණ.

අක්තපත්‍රය පිළිගැන්වීම ශ්‍රීලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ ගරු අග්‍රාමාත්‍ය රත්නසිරි වික්‍රමනායක මැතිතුමා අතින් සිදුකෙරුණු අතර, සයිප්‍රස්හි ශ්‍රීලංකා බෞද්ධ සංගමයේ ගෞරවනීය ආරාධනයෙන් කැළණිය විශ්වවිද්‍යාලයේ කුලපති සහ විද්‍යාලංකාර පරිවේණාධිපති ආචාර්ය පූජ්‍ය වැලමිටියාවේ කුසලධම්ම නාහිමියන්ද, කෝට්ටේ නාගවිහාරාධිපති පූජ්‍ය මාදුළුවාවේ සෝභිත නාහිමියන්ද, පූජ්‍ය වල්පොල කළ්‍යාණතිස්ස නාහිමියන්ද, තැඹිලිගස්මුල්ල ශ්‍රී ධීරානන්ද විද්‍යායතන පරිවේණාධිපති පූජ්‍ය පානකාවේ පේමරතන නාහිමියන්ද, පරිවේණාචාර්ය ශාස්ත්‍රවේදී උඩංගාවේ සුමේධ හිමිපාණන් සහ ශාස්ත්‍රපති පූජ්‍ය පැලැම්පිටියේ මහින්ද ස්වාමීන්වහන්සේ ඇතුළු සංඝයාවහන්සේලා මෙම උත්සවයට වැඩමකර සිටියහ.

ආරාධිත අමුත්තන් ලෙස ඉතාලියේ ශ්‍රීලංකා තානාපති සහ සයිප්‍රසයේ මහකොමසාරිස්වර ජනාධිපති නීතිඥ හේමන්ත වර්ණකුලසූරිය මහතා, සයිප්‍රසයේ ශ්‍රීලංකා කොන්සියුලේට් ජනරාල් දෝරෝස් ජෙරොපොලොවුස් මහතා, සයිප්‍රසයේ ව්‍යාපාරික දානපති අනුර පෙරේරා මහතා, හසන්ත හෙට්ටිආරච්චි මහතා සහ සයිප්‍රසයේ අභ්‍යන්තර කටයුතු අමාත්‍යංශයේ නිලධාරීතුමා ද සහභාගිවූහ.

**සටහන -**
♦ **නිරංජලා මනෝහාරි**
**Nicosia - Cyprus**



*Photos*: රුවන් චමින්ද Ruwan Chaminda - Cyprus







## සයිප්‍රස් වීදිවල බෞද්ධ ධජ ලෙළදුන් දවස

**ස**යිප්‍රසය විශාලත්වයෙන් තුන්වන මධ්‍යධරණී දූපත ලෙස සැලකේ. සංචාරකයින් වසරකට මිලියන තුනකට ආසන්නව පැමිණෙන, දේශගුණිකව එය ඉතා හිතකර රටකි. කලින් බ්‍රිතාන්‍ය කොලනියක්ව පැවති එය 1960 දී නිදහස ලැබුවාය. ග්‍රීක, තුර්කි හා සිප්‍රියොට් ආදී ජන කොටස්වලින් සැදුම්ලත් සයිප්‍රසයේ ආගම් කීපයක් ඇදහීම කෙරේ. ක්‍රිස්තියානි, යුදෙව්, ආර්මේනියන් හා මුස්ලිම් ආදී විවිධ ඇදහිලි ඇති එහි බෞද්ධයින් ඇත්තේ ඉතා ටික දෙනෙකි. ඒ බෞද්ධයෝද සයිප්‍රසයේ රැකියාවට ගොස් සිටින ශ්‍රීලාංකිකයෝ වෙති. එහෙත් ඔවුන් තම මව්බිමට හා තම සංස්කෘතියට ආදරේ ඇති පිරිසක් බවත්, ශ්‍රීලංකාවේ ආර්ථිකයට ඔවුන්ගෙන් වන ඉමහත් දායකත්වය ඉහළින් අගැයිය යුතු බවත් මෙහිදී නොපැකිල කිව යුතුය. මේ සිංහල තරුණ පිරිස සයිප්‍රසයේ වීදියක බෞද්ධ කොඩි රැගෙන පෙරහරින් ගමන්කිරීම ලාංකික කාගේ වුව ද සිත්හි අභිමානය දල්වන්නේය. හිතෛෂීනි! ඔබට ජයම වේවා! - **ලංකාවිත්ති**


**Duke's Court Travel**
DUKE'S COURT TRAVEL Travel Management

Fly to Colombo

| | | |
|---|---|---|
| SriLankan | SriLankan Airlines | fr £395 + Taxes |
| Qatar Airways | Qatar Airways | fr £326 + Taxes |
| Kuwait Airways | Kuwait Airways | fr £355 + Taxes |
| Emirates | Emirates | fr £737 + Taxes |
| Etihad Airways | Etihad Airways | fr £495 + Taxes |

Note: All fares mentioned are low season / terms & conditions apply.

www.easy-flights.tv

020 8748 3535

3045 ATOL PROTECTED · AITO The Association of Independent Tour Operators · IATA

204 King Street, London W6 0RA






**ඔබගේ නෑදෑ හිතමිතුරන්ට පහසුව, සුරක්ෂිතව මුදල් යැවීම සඳහා එකම විශ්වාසවන්ත නාමය**

FAST CASH
SEND TODAY - COLLECT TODAY

- * කොමර්ෂල්, හැටන් නැෂනල් සහ ලංකා බැංකු සමග එක්ව, දිවයින පුරා 500කට අධික ශාඛා ජාලයකින් එදිනම මුදල් ලබාගැනීමේ පහසුව
- * ලංකාවේ ඕනෑම බැංකු ගිණුමකට මුදල් ක්ෂණිකව බැර කිරීම
- * ඔබගේ NRFC / RFC විදේශ ගිණුම් වලට මුදල් බැර කිරීම
- * රටවල් 120කට මුදල් යැවීමේ පහසුව
- * ඔබගේ මුදල් මැද පෙරදිග අතරමැදියන් වෙත නොයා ක්ෂණිකව හා සෘජුවම ගිණුමට බැර කිරීමේ විශ්වාසය

Transfer Fees From only £5

COMMERCIAL BANK · BOC BANK OF CEYLON · HNB · HSBC · සම්පත් බැංකුව SampathBank · PEOPLE'S BANK · Standard Chartered

020 8886 4488
Head Office: 125-127 Bramley Road, Oakwood, London, N14 4UT

MCG Strong. Safe. Reliable. Mike Cooke Group
දින 7ම විවෘතය